# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**2021 සැප්තැම්බර් මස 24 වන දින**

**II වන කොටස**

**අතිරේකය**

**(2021.09.27 දින නිකුත් කරන ලදී)**


# කැලණිය බෞද්ධ කාන්තා පුණ්‍යායතන සමිතිය (සංස්ථාගත කිරීමේ)

*(පෞද්ගලික මන්ත්‍රීවරයන්ගේ පනත් කෙටුම්පතකි)*

**කැලණිය බෞද්ධ කාන්තා පුණ්‍යායතන සමිතිය සංස්ථාගත කිරීම සඳහා වූ පනත් කෙටුම්පතකි**

පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු පූජ්‍ය අතුරලියේ රතන හිමි විසින්
පාර්ලිමේන්තුවේ දී ඉදිරිපත් කිරීම පිණිසයි


ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ 5, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිල දී ලබාගත හැක.

මිල : රු. 24.00 තැපැල් ගාස්තුව : රු. 15.00

මෙම ගැසට් අතිරේකය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

# කැලණිය බෞද්ධ කාන්තා පුණ්‍යායතන සමිතිය (සංස්ථාගත කිරීමේ)

## කැලණිය බෞද්ධ කාන්තා පුණ්‍යායතන සමිතිය සංස්ථාගත කිරීම සඳහා වූ පනතකි

*පූර්විකාව*

"කැලණිය බෞද්ධ කාන්තා පුණ්‍යායතන සමිතිය" යනුවෙන් හඳුන්වනු ලබන හා සඳහන් කරනු ලබන, පුණ්‍යායතන සමිතිය වසර පනස් හයක් (56) පුරා සාමාජිකයන් එකඟ වූ රීතිවලට අනුව, එකී සමිතිය සම්බන්ධ සියලු පරමාර්ථ සහ කාරණා ඵලදායී ලෙස ඉටු කිරීමේ කාර්යය සඳහා මෙතෙක් ශ්‍රී ලංකාවේ පිහිටුවා තිබූ හෙයින් ද:

එකී සමිතිය පිහිටුවනු ලැබුවේ යම් පරමාර්ථ සහ කාරණා සඳහා ද, එම පරමාර්ථ සහ කාරණා එකී සමිතිය මෙතෙක් කල් විසින් සාර්ථක ලෙස ක්‍රියාත්මක කර සහ ඉටු කර ගෙනගොස් ඇති හෙයින් ද:

එකී පුණ්‍යායතන සමිතිය සංස්ථාගත කරනු ලැබීමට ඉල්ලුම් කර ඇති අතර, එකී ඉල්ලීම ඉටුකිරීම මහජන යහපත පිණිස වන හෙයින් ද:

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:—

*ලුහුඬු නාමය*

**1.** මේ පනත 2021 අංක       දරන කැලණිය බෞද්ධ කාන්තා පුණ්‍යායතන සමිතිය (සංස්ථාගත කිරීමේ) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

*කැලණිය බෞද්ධ කාන්තා පුණ්‍යාතනය සංස්ථාගත කිරීම*

**2.** මේ පනත ක්‍රියාත්මක වීම ඇරඹෙන දින සිට හා ඉන් පසුව (මෙහි මින්මතු "සමිතිය" යනුවෙන් හඳුන්වනු ලබන) "කැලණිය බෞද්ධ කාන්තා පුණ්‍යායතන සමිතියේ" වර්තමාන සාමාජිකාවන්ව සිටින තැනැත්තන් හෝ මෙයින් සංස්ථාපනය කරනු ලබන හා මින්මතු සංස්ථාවට බඳවාගනු ලබන තැනැත්තන් කැලණිය බෞද්ධ කාන්තා පුණ්‍යායතන සමිතිය යන නාමය සහ අභිධානය යටතේ අවිච්ඡින්න පැවැත්මක් ඇති (මෙහි මින්මතු "සංස්ථාව"යනුවෙන් සඳහන් කරනු ලබන) සංස්ථාවක් විය යුතු අතර, පොදු මුද්‍රාවක් තබා ගෙන එය පාවිච්චි කිරීමේ ද, ස්වකීය අභිමතය පරිදි එය

වෙනස් කිරීමේ ද, පූර්ණ බලය සහ අධිකාරය ඒ සංස්ථාවට ඇත්තේ ය. තවද එකී සංස්ථාවේ නාමයෙන් ඒ සංස්ථාව විසින් ද එයට විරුද්ධව ද නඩු පවරනු ලැබිය හැකි ය.

සංස්ථාවේ පොදු පරමාර්ථ

3. සංස්ථාව සංස්ථාපනය කරනු ලබන්නේ යම් පොදු පරමාර්ථ සඳහා ද, ඒ පොදු පරමාර්ථ පහත සඳහන් පරිදි විය යුතු ය :—

(අ) බෞද්ධ ආගමිකයන් වෙනුවෙන් භාවනා ක්‍රම ප්‍රගුණ කිරීම සඳහා අවශ්‍ය පහසුකම් සැලසීම;

(ආ) බුදු දහම පිළිබඳ ලෝකයේ පළවන පොත් පත් සඟරා රැස්කර ඒවා බෞද්ධ ආගමිකයන්ට පහසුවෙන් ලබා ගැනීමට සැලැස්වීම;

(ඇ) මෙම සංස්ථාව සමාජ සේවකයන්, විද්වතුන්, දනපතියන්, හා පරාර්ථකාමීන් සමඟ ද, ශ්‍රී ලංකාව තුළ ඇති වෙනත් සමාන සුභ සාධක සමිති හා පදනම් සමඟ ද, යහපත් සම්බන්ධතාවයන් හා සුහදතාවයන් ඒකාබද්ධව දියුණු කිරීම;

(ඈ) සංස්ථාවේ පරමාර්ථ ප්‍රවර්ධනය කිරීම සහ වැඩි දියුණු කිරීම සඳහා යෝග්‍යයයි සංස්ථාව විසින් සලකනු ලබන පොත්, පත්‍රිකා සඟරා මුද්‍රණය කිරීම, ප්‍රකාශයට පත් කිරීම බෙදහැරීම;

(ඉ) සංස්ථාවේ සාමාජිකාවන්ට සමාන පරමාර්ථ ඇති වෙනත් සංගම් සමිති හා සංවිධාන සමග සහයෝගයෙන් කටයුතු කිරීම;

(ඊ) සියලු දෙනාටම බුදු දහම අවබෝධකර දීම සහ බුදු දහම ලොව පුරා පැතිරවීමට අවශ්‍ය පියවර ගැනීම.

සංස්ථාවේ කටයුතු කළමනාකරණ කිරීම

4 (1) සංස්ථාවේ රීතිවලට අනුකූලව තෝරාපත් කරගනු ලබන සභාපති, උපසභාපති, ප්‍රධාන ලේකම්, උපලේකම්වරු දෙදෙනකු, භාණ්ඩාගාරික, උපභාණ්ඩාගාරික සහ අනුශාසක දෙදෙනා ඇතුළු වෙනත් සාමාජිකයන් (16) දහසය දෙනකු ගෙන් සමන්විත වූ (මෙහි මින්මතු “මණ්ඩලය” යනුවෙන් සඳහන් කරනු ලබන) කළමනාකරණ මණ්ඩලයක් විසින් මේ පනතේ අනෙකුත් විධිවිධානවලට සහ එකී රීතිවලට යටත්ව සංස්ථාවේ කටයුතු කළමනාකරණය කරනු ලැබිය යුතුය.

(2) මෙම පනත ක්‍රියාත්මක වන දිනයේ දී සමිතියේ විධායක කමිටුවේ සාමාජිකාවන් වූ තැනැත්තියන්ගෙන් පළමු විධායක කමිටුව සමන්විත විය යුතු ය.

(i) විධායක කමිටුව මසකට වරක් රැස්විය යුතු ය;

(ii) සමිති පරමාර්ථ හා ව්‍යවස්ථාව අනුව කටයුතු මෙහෙයවීම කළ යුතු ය;

(iii) විධායක කමිටුව නොදන්වා පිට පිට තුන්වරක් රැස්වීමට නොපැමිණි නිලධාරීන් එම ධුරය හැරගිය අය ලෙස පිළිගැනේ;

(iv) විධායක කමිටුවෙන් ඉවත් වූ නිලධාරීන් වෙනුවට වෙනත් සාමාජිකාවන් පත්කර ගැනීමට විධායක සභාවට බලය ඇත;

(v) අත්‍යාවශ්‍ය අවස්ථාවල දී කෙටිකාලීන දැනුම්දීමකින් පසු විධායක කමිටුවේ හදිසි රැස්වීම් කැඳවිය හැකි ය;

(vi) විධායක කමිටුවේ ධුර කාලය වර්ෂ තුන (03) ක් සේ සැලකිය යුතු ය.

(3) (1) (i) කිරිබත්ගොඩ ශ්‍රී සුදර්ශනාරාමාධිපති, රුහුණු විශ්වවිද්‍යාලයේ ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය අති පූජ්‍ය මාකොළ මංගල නාහිමියන් සංස්ථාවේ ප්‍රධාන අනුශාසකවරයා විය යුත්තේ ය;

(ii) එකී පූජ්‍ය මාකොළ මංගල නාහිමි අපවත්වීමෙන් පසු හෝ ඉල්ලා අස්වීමෙන් පසු හෝ සභාපතිගේ නිර්දේශය මත සුදුසු බෞද්ධ හිමි නමක් ප්‍රධාන අනුශාසක වශයෙන් විධායක කමිටුව විසින් පත්කළ යුතු ය;

(2) (i) සමිතියේ ගිහි අනුශාසක ධුරයන් දරන විශ්‍රාමික විදුහල්පති (විදුහල්පති 1 ශ්‍රේණිය, සිංහල පුහුණු ශාස්ත්‍රවේ දී අධ්‍යාපන ඩිප්ලෝමා සහතික දරන) පී.ජී.එස්. පෙරේරා මහත්මිය සහ ළමා සංවර්ධන

ඩිප්ලෝමාධාරී සෙත්මග සිගිති සෙවන විදුහල්පතිනි හර්ෂණී නවරත්න මහත්මිය සංස්ථාවේ ගිහි අනුශාසිකාවන් වන්නේ ය;

(ii) එකී ගිහි අනුශාසිකාවන් මියයාමෙන් හෝ ඉල්ලා අස්වීමෙන් පසු පහත සඳහන් සුදුසුකම්වලින් යුක්ත ගිහි අනුශාසකවරියන්, සභාපතිනිය ඇතුළු ප්‍රධාන විධායක කමිටුව විසින් පත් කළ යුතු ය. ඒ සඳහා සුදුසුකම් විය යුත්තේ-

(i) සමිතියේ දීර්ඝකාලීන සාමාජිකත්වය දැරීම;

(ii) සමාජ හා ආගමික වශයෙන් අත්දැකීම් බහුල වීම;

(iii) උගත්, බුද්ධිමත්, සමාජය පිළිගත් තැනැත්තියක වීම.

4. (1) භාරකාර මණ්ඩලය:—

වාර්ෂික මහා සභා රැස්වීමෙන් පසු පවත්වන ප්‍රථම විධායක රැස්වීමේ ප්‍රධාන සභාපති, උපසභාපති, ලේකම්, උප ලේකම් දෙදෙනා භාණ්ඩාගාරික, උපභාණ්ඩාගාරික, අනුශාසකවරු දෙදෙනා සහ නිවාස කළමනාකාරිණිය සහිත විධායක සභිකයකුගෙන් යුත් කාරක මණ්ඩලයක් පත් කළ යුතු ය.

(අ) භාර කාර මණ්ඩලය විධායක කමිටුවේ උපදෙස් අනුව කටයුතු කළ යුතු ය;

(ආ) භාරකාර මණ්ඩලය අවුරුදු තුනක (03) කාලයක් තුළ එම කාර්ය භාරය දැරිය යුතු ය;

(ඇ) මෙහි සාමාජිකාවෝ අවුරුදු තුනකට (03) වැඩි කාලයක් සමිතියේ ක්‍රියාකාරී සාමාජිකාවන් විය යුතු ය;

(ඈ) මෙම සමිතියට නිශ්චල හා චංචල දේපළවල අයිතිය හෝ හිමිකම් නීත්‍යානුකූල හිමිකම් අවශ්‍ය වූ විටක දී පැවරීම, උගස් කිරීම, විකිණීමට වැඩි දියුණු කිරීමට, බදු දීමට,

හුවමාරු කිරීම පිළිබඳ ගිවිසුම්වල අත්සන් තැබීම හා මිල දී ගැනීම, ගොඩනැගිලි ඉදිකිරීමට එකී කටයුතු සඳහා අවශ්‍ය සියලු කටයුතු කිරීමට බලය තිබේ.

(2) නිවාස කමිටුව:—

නිවාස කළමනාකාරිණිය ඇතුළු සාමාජිකාවන් (06) හයදෙනකු මෙම කමිටුවට පත්කරගත හැකි ය.

(අ) නිවාස කමිටුවේ සභාපතිනිය විධායක කමිටු සාමාජිකාවක් විය යුතු අතර අනිත් සාමාජිකාවන් සමිති සාමාජිකත්වය දැරිය යුතු ය;

(ආ) ඊළඟ වාර්ෂික මහා සභා රැස්වීම දක්වා නියමිත කාර්ය භාරය දැරිය යුතු ය;

(ඇ) වැබඩ, කිරිල්ලවල, ජයමාවත, 307/16, සෙනෙහස ළමා සංවර්ධන ආයතනයේ දියණිවරුන්ගේ අධ්‍යාපනය, සෞඛ්‍ය, රැකවරණය හා වෙනත් අවශ්‍යතා පිළිබඳ සොයා බලා නිර්දේශ කරන ක්‍රමවේදය මාසික සභාවට ඉදිරිපත් කළ යුතු ය;

(ඈ) පිටපිට රැස්වීම් 04 (හතරකට) නොදන්වා නොපැමිණීමෙන් සාමාජිකයත්වය අහෝසි වේ;

(ඉ) අවශ්‍යතා අනුව නිවාස කමිටුව පත්කර ගැනීමේ බලය විධායක සභාවට ඇත.

සාමාජික නාමලේඛනය

**5.** (1) මෙම පනත ක්‍රියාත්මක වීමට පෙරාතුව ම වූ දිනයේ දී සමිතියේ සාමාජිකාවක වූ සෑම තැනැත්තියකගේම සහ ඉන්පසුව සංස්ථාවේ සාමාජිකාවක වශයෙන් යථා පරිදි ඇතුළත් කරනු ගනු ලබන සෑම තැනැත්තකුගේම නම ඇතුළත් සාමාජික නාම ලේඛනයක් පවත්වාගෙන යාමට මණ්ඩලය විසින් කටයුතු කළ යුතු ය.

(2) නාමලේඛනයේ පහත සඳහන් විස්තරය ඇතුළත් විය යුතු ය:—

සාමාජකාවගේ නම, ලිපිනය, රැකියාව, ලේඛනයේ සටහන් කරනු ලැබූ දිනය, සාමාජිකත්වය අවසන් කළ දිනය.

**6.** සාමාජිකත්වය පහත සඳහන් වර්ගයන්ට අයත් ය:— සාමාජික වර්ග

(i) සාමාන්‍ය සාමාජිකාවෝ:—
ඇතුළත්වීමේ ගාස්තුව හා මාසික සාමාජික මුදල් ගෙවිය යුතු ය. (මාසික හෝ වාර්ෂිකව ගෙවිය හැකි ය) මහා සභාවේ දී ගන්නා තීරණයක් මත සමිති නඩත්තු මුදල් හා සුභ සාධන මුදල් ගෙවිය යුතු ය.

(ii) යාවජීව සාමාජිකාවෝ:—
ඇතුළත්වීමේ ගාස්තුව හා යාවජීව සාමාජික මුදල් එක්වර ගෙවිය යුතු ය. මහා සභාවේ දී ගන්නා තීරණයන් මත සමිති නඩත්තු මුදල් සහ සුභ සාධන මුදල් ගෙවිය යුතු ය.

(iii) සම්මාන සාමාජිකාවෝ:—
ඇතුළත්වීමේ ගාස්තුව හෝ සාමාජික ගාස්තු අය නොකෙරේ. සම්බුද්ධ ශාසනයට විශිෂ්ට සේවයක් කළ සමිතියේ සාමාජිකයකු වීමට සුදුසුකම් ඇති යම් තැනැත්තියකට විධායක සභාවට යෝජනාවක් ඉදිරිපත් කර තුනෙන් දෙකක් 2/3 ඡන්දයෙන් සම්මත වීමෙන් පසු සම්මාන සාමාජිකත්වය හිමි වේ. සම්මාන සාමාජිකාවෝ පහකට (05) නොවැඩි විය යුතු ය. සම්මාන සාමාජිකත්වය ප්‍රදානය කරනු ලබන තැනැත්තියට සාමාජික අයිතිවාසිකම් හිමි වේ.

**7.** විධායක සභාවේ සාමාජිකයකුවීමට නුසුදුසුකම්:— විධායක සභාවේ සාමාජිකාවක වීමේ නුසුදුසුකම්

(i) කැලණිය බෞද්ධ කාන්තා සමිතියේ සාමාජිකාවක නොවීම;

(ii) බෞද්ධයකු නොවීම;

(iii) සිහිවිකල තැනැත්තකු වීම;

(iv) දුරාචාරාත්මක වැරැද්දක් කළ බවට නිසි අධිකරණයකින් තීන්දු කරන ලද තැනැත්තියක වීම.

සංස්ථාවේ බලතල

**8.** (1) මේ පනතේ හෝ වෙත් යම් ලිඛිත නීතියක විධිවිධානයකට යටත්ව සංස්ථාවේ පරමාර්ථ ඉටු කර ගැනීම සඳහා-

(අ) (i) සංස්ථාවට අදාළ බැංකු ගිණුම් විවෘත කිරීම පවත්වාගෙන යාම සහ වැසීම;

(ii) සංස්ථාවට දායක මුදල්, ප්‍රදානයන්, පරිත්‍යාග හෝ සියලුම වර්ගවල ආධාර ඉල්ලා සිටීමට හා භාර ගැනීමට;

(ආ) (i) වැබඩ, කිරිල්ලවල, ජයමාවත, 307/16 ස්ථානයේ ඇති සෙනෙහස ළමා සංවර්ධන මධ්‍යස්ථානය (සෙනෙහස දූරි සෙවන) වෙනුවෙන් බැංකු ගිණුම් විවෘත කිරීම, පවත්වාගෙන යාම;

(ii) වැබඩ, කිරිල්ලවල, ජයමාවත, 307/16 ස්ථානයේ ඇති සෙනෙහස ළමා සංවර්ධන මධ්‍යස්ථානය (සෙනෙහස දූරි සෙවන) වෙනුවෙන් පරිත්‍යාග කරන සියලුම වර්ගවල ආධාර, පරිත්‍යාග, ත්‍යාග ඉල්ලා සිටීමට හෝ භාරගැනීමට;

(ඇ) යම් තැනැත්තකු යම් සමාගමක් හෝ පුද්ගල මණ්ඩලයක් සමග ගිවිසුම්වලට හෝ කොන්ත්‍රාත්වලට එළඹීමට;

(ඈ) සමිතියේ කාර්ය සඳහා අවශ්‍යවන්නා වූ ඉඩම් හෝ ගොඩනැගිලි මිලයට ගැනීමට, අත්කර ගැනීමට, කුලියට ගැනීමට, ඉදිකිරීමට හෝ අන්‍යාකාරයෙන් ලබා ගැනීමට;

(ඉ) අවශ්‍ය නිලධාරීන් සහ සේවකයන් සේවයේ නියුක්තකර ගැනීම, සේවයේ යෙදවීම සහ සේවයෙන් පහකිරීමට; සහ

(ඊ) සංස්ථාව විසින් තීරණය කරනු ලබන සේවක වැටුප් සහ දීමනා සහ පාරිතෝෂික ගෙවීමට හා සංස්ථාවේ කාර්ය සඳහා ශ්‍රී ලංකාවේ සේවක පිරිස් පුහුණු කිරීමට.

(2) සංස්ථාවේ පරමාර්ථ හෝ පරමාර්ථ අතුරෙන් යම් පරමාර්ථයක් ප්‍රවර්ධනය කිරීම හෝ නංවාලීම සඳහා අවශ්‍ය හෝ යෝග්‍ය කවර ආකාරයක හෝ සියළු ක්‍රියා කිරීමේ, කාරණා ඉටු කිරීමේ හා දේවල් ක්‍රියාවේ යෙදවීමේ බලය සංස්ථාවට ඇත්තේ ය.

**9.** (1) සංස්ථාවේ මහා සභා රැස්වීමක දී ඊට පැමිණ ඡන්දය දෙන සාමාජිකයන්ගෙන් තුනෙන් දෙකකට නොඅඩු බහුතර ඡන්දයෙන් මේ පනතේ සහ වෙනත් යම් ලිඛිත නීතියක විධිවිධානවලට අනනුකූල නොවන පරිදි පහත දැක්වෙන සියලු කාරණා හෝ ඉන් කිසිවක් සඳහා කලින් කල රීති සෑදීම නීත්‍යානුකූල වන්නේ ය:—

සංස්ථාවේ රීති

(අ) සාමාජිකයන් වර්ග කිරීම, එක් එක් පන්තියට අයත් සාමාජිකයන් විසින් ගෙවිය යුතු ගාස්තු, ඔවුන් ඇතුළත් කර ගැනීම, ඉවත් කිරීම හෝ ඔවුන් ඉල්ලා අස්වීම;

(ආ) සංස්ථාවේ සාමාජිකයන් අතරින් විධායක කමිටුවට නිලධාරීන් තෝරා පත් කර ගැනීම;

(ඇ) සංස්ථාවේ විධායක කමිටුවේ සහ අනෙකුත් විවිධ නිලධාරීන්ගේ, නියෝජිතයන්ගේ සහ සේවකයන්ගේ කාර්යයන් යුතුකම් සහ වගකීම්-

(ඈ) (i) රැස්වීම්වල කටයුතු කිරීමේ දී අනුගමනය කළ යුතු කාර්ය පටිපාටිය සහ සංස්ථාවේ කටයුතු කළමනාකරණය කිරීම;

(ii) එකී රීති (1) වන උපවගන්තියේ රීති සාදන ආකාරයෙන්ම ඒවාට යමක් එකතු කිරීම, සංශෝධනය කිරීම, හෝ අවලංගු කිරීම කරනු ලැබිය හැකි ය;

(iii) සංස්ථාවේ සියලුම සාමාජිකයන් සංස්ථාවේ රීතිවලට යටත් විය යුතු ය.

**10.** (1) සංස්ථාවට එහිම අරමුදලක් තිබිය යුතු ය.

සංස්ථාවේ අරමුදල

(2) සංස්ථාවට ලැබෙන ත්‍යාග, පරිත්‍යාග, සම්මාදම් මුදල්, දායක මුදල්, ගාස්තු වශයෙන් සංස්ථාවට ලැබෙන සියලුම මුදල් මණ්ඩලය විසින් අනුමත කරනු ලබන බැංකුවක හෝ බැංකු කීපයක සංස්ථාවේ නමින් තැන්පත් කළ යුතු ය.

(3) මේ පනත යටතේ ස්වකීය බලතල, ක්‍රියාත්මක කිරීමේ දී හා ඉටු කිරීමේ දී සංස්ථාව විසින් දරන ලද වියදම් පියවීම කිසිවක් සඳහා අවශ්‍ය සියලු මුදල් අරමුදලින් ගෙවනු ලැබිය යුතු ය.

**සමිතිය විසින් ගෙවිය යුතු සහ අයවිය යුතු ණය**

**11.** මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන දිනයට පෙරාතුව ම වූ දිනයේ දී සමිතිය විසින් ගෙවිය යුතු වූ තිබුණු සියලු ම ණය හා බැරකම් මෙයින් සංස්ථාපනය කරනු ලබන සංස්ථාව විසින් ගෙවනු ලැබිය යුතු අතර, එදිනට මධ්‍යස්ථානයට අයවිය යුතුව තිබුණු සියලුම ණය සහ සියලු දයක මුදල් සහ සම්මාදම් මුදල් මෙම පනතේ කාර්යය සඳහා සංස්ථාවට ගෙවනු ලැබිය යුතු ය.

**මුදල් වර්ෂය**

**12.** සංස්ථාවේ මුදල් වර්ෂය ලිත් වර්ෂය විය යුතු ය.

**ගිණුම් සහ විගණනය**

**13.** (i) සංස්ථාවට ලැබුණු සහ සංස්ථාව විසින් ආදායම් හා වියදම්, ලැබූ වත්කම්, බැරකම් හා වෙනත් සියලු ගණුදෙනු පිළිබඳ නිසි ගිණුම් පවත්වා ගෙන යාමට සංස්ථාව විසින් කටයුතු සැලැස්විය යුතු ය.

(ii) සෑම වර්ෂයක දී ම සුදුසුකම්ලත් විගණකවරයකු විසින් සංස්ථාවේ වාර්ෂික අවසාන ගිණුම් විගණනය කළ යුතු අතර වාර්ථාව මහා සභා රැස්වීමේ දී ඉදිරිපත් කළ යුතු ය.

(iii) මේ වගන්තියේ කාර්ය සඳහා "සුදුසුකම්ලත් විගණකවරයා" යන්නෙන්-

(අ) ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීන්ගේ ආයතනයේ හෝ නීතිය මගින් පිහිටුවන ලද වෙනත් යම් ආයතනයක සාමාජිකයකු වන සහ එකී ආයතනයේ සභාව විසින් ගණකාධිකාරයකු ලෙස සේවයේ යෙදීමට නිකුත් කරන ලද සහතිකයක් ඇති තැනැත්තෙකු; හෝ

(ආ) එක් එක් නේවාසික කොටස්කරු ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීන්ගේ ආයතනයේ හෝ නීතිය මගින් පිහිටුවන ලද වෙනත් යම් ආයතනයක සාමාජිකයකු

වන්නා වූ ද, ගණකාධිකාරිවරයකු ලෙස වෘත්තියෙහි යෙදීම සඳහා එකී ආයතනයේ සභාව විසින් නිකුත් කරන ලද සහතිකයක් සන්තකයේ දරන්නා වූ ද, සාමාජිකයන්ගෙන් යුතු එවැනි ගණකාධිකාරී සමාගමක් හෝ ආයතනයක්,

අදහස් වේ.

**විසුරුවා හැරීමේ දී ඉතිරි වන දේපළ**

**14.** සංස්ථාව විසුරුවා හැරීමේ දී එහි සියලු ණය හා විසුරුවා හැරීමේ දී බැරකම් පියවීමෙන් පසු කවර හෝ දේපළක් ඉතිරි වූ ද, ඉතිරිවන ඒ දේපළ සංස්ථාවේ සාමාජිකයන් අතර බෙදා දෙනු නොලැබිය යුතු අතර, සංස්ථාවේ පරමාර්ථවල සමාන පරමාර්ථ ඇති ස්වකීය රීති අනුව යම් ආදායමක් හෝ ලාභයක් ස්වකීය සාමාජිකයන් අතර බෙදදීම තහනම් කරනු ලැබ ඇත්තා වූ ද, වෙනත් ආයතනයකට හෝ ආයතනවලට ඒ දේපළ දීම හෝ පැවරීම කරනු ලැබිය යුතු ය. ඒ සංගමය හෝ සංගම් කවරේ ද යන බව සංස්ථාව විසුරුවා හැරීමේ දී හෝ විසුරුවා හැරීමට පෙරාතුව ම හෝ සංස්ථාවේ සාමාජිකයන් විසින් තීරණය කළ යුතු ය.

**සංස්ථාවේ මුද්‍රාව**

**15.** සංස්ථාවේ මුද්‍රාව සභාපතිවරියගේ භාරයේ තිබිය යුතු අතර, සභාපති සහ ලේකම්වරිය ඉදිරියේ හැර සංස්ථාවේ මුද්‍රාව කිසිදු සාධන පත්‍රයකට නොතැබිය යුතු අතර, තමන් පැමිණ සිටි බවට සළකුණක් වශයෙන් ඔවුන් දෙදෙනාම ඒ සාධණ පත්‍රයෙහි තම නම අත්සන් කළ යුතු ය. තව ද ඒ අත්සන් කිරීම යම් තැනැත්තකු විසින් සාක්ෂිකරුවකු වශයෙන් කරන ලද අත්සන් කිරීමට පරිබාහිරව විය යුතු ය.

**ජනරජයේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම**

**16.** ජනරජයේ හෝ යම් රාජ්‍ය මණ්ඩලයක හෝ සංස්ථාවක අයිතිවාසිකම්වලට මේ පනතෙහි ඇතුළත් කිසිවකින් හානියක් හෝ බලපෑමක් නොවිය යුතු ය.

**අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව**

**17.** මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.